# ජීව-පරිසර විද්‍යාත්මක න්‍යායය

කේ.ඩී. නතාලියා ප්‍රනාන්දු

## හැඳින්වීම

මෙම න්‍යාය මගින් ළමයාගේ සංවර්ධනය සඳහා ඔහු හෝ ඇය ජීවත්වන පරිසර පද්ධතිය (Context of The System) දායකවන ආකාරය දක්වනු ලබයි. මෙහිදී පරිසරයේ පවතින මෙම විවිධ පද්ධතීන් ස්ථරයන්වලට (Layers) බෙදා දක්වා හඳුන්වා දී ඇත. මෙය මුලින් ම පරිසරවිද්‍යාත්මක න්‍යාය (Ecological Theory) ලෙස ඉදිරිපත් කරන ලදී. පසුකාලිනව ජීව-පරිසර පද්ධති න්‍යාය (Bioecological Systems Theory) ලෙස පළමු නම වෙනස් කර නැවත ඉදිරිපත් කර තිබේ. ඊට හේතුව ලෙස දැක්වෙන්නේ, ළමයාගේ සංවර්ධනයට හා හැඩගැස්මට දරුවා තුළ පවතින ඔහුගේ ම ජීවවද්‍යාත්මක පදනමේ බලපෑම අවධාරණය කිරීමයි. මෙම ජීවවිද්‍යාත්මක සාධකයන් හා පරිසරයේ පවතින විවිධ පද්ධතීන් අතර අන්තර් සබඳතාව මූලික කොටගෙන ළමයාගේ සංවර්ධනය සිදුවන ආකාරය දක්වනු ලබයි. මෙම පද්ධතීන් එකිනෙක අතර ද ළමයා ජීවත්වන පරිසර පද්ධතීන් තුළ ද යම් ස්ථරයක වෙනසක් හෝ ගැටලුවක් පැන නැගීම මගින් එය අනෙක් පද්ධතීන් කෙරෙහි ද පැතිර යාමට හැකියාව පවතී. දරුවාගේ ජීවවිද්‍යාත්මක පරිණතියත් (Biological Maturity) සමග ඔහු වටා සිටින පුද්ගලයන් හා පරිසර පද්ධතීන් දරුවාගේ සංවර්ධනයට හා චර්යාව සැකසීමෙහි ලා දායක වන බව පර්යේෂකයන් දක්වා තිබේ. එහිදී මෙම පරිසර පද්ධතීන් ඍජුව හා වක්‍රව දරුවාගේ සංවර්ධනයට දායකවන ආකාරය පිළිබඳ ව මෙම ලිපිය මගින් සාකච්ඡා කිරීමට නියමිත ය.

## පරිසර පද්ධති න්‍යාය

ඇමරිකානු සංවර්ධන මනෝවිද්‍යාඥයෙක් වන යූරි බ්‍රොන්ෆෙන්බ්‍රෙනර් (Urie Bronfenbrenner (1917-2005)) විසින් 1979 දී ළමා සංවර්ධනය පිළිබඳ පරිසර න්‍යාය (Ecological Theory

of Child Development) ඉදිරිපත් කරන ලදී. මෙම න්‍යාය මගින් අවධාරණය කරනු ලබන්නේ, ළමයා ජීවත්වන සමාජයත්, එහි අන්තර් පුද්ගල ක්‍රියාකාරිත්වයත් ළමයාගේ සංවර්ධනයට බලපාන්නේ කෙබඳු ආකාරයෙන් ද යන්නයි. මොහුට මෙම න්‍යාය ඉදිරිපත් කිරීමට මූලික අඩිතාලම සපයන ලද්දේ, ලෙව් විගොට්ස්කිගේ (Lev Vygotsky (1896-1834)) සමාජ සංස්කෘතික න්‍යාය (Socio Cultural Theory) වන අතර එමගින් විස්තර කෙරෙන ඉගෙනුම් ක්‍රියාවලිය කෙරෙහි ළමයා ජීවත් වන සමාජ සංදර්භයේ බලපෑමත්, එලෙස ම කර්ට් ලෙවින් (Kurt Lewin1890-1947)) වැනි මනෝවිද්‍යාඥයන්ගේ අදහස් වන පුද්ගලයාගේ චර්යාව කෙරෙහි සමාජ අත්දැකීම් බලපාන ආකාරයත්, එමෙන් ම බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්ගේ ශාස්ත්‍රීය සගයෙක් වන ස්ටෙෆාන් සෙසීගේ (Stephan Ceci) අධ්‍යයනයන් ද හේතු වූ බව පැහැදිලි වේ (Damon & Lerner, 1998: p.27). මෙම න්‍යායයේ විස්තර කිරීම්වලට අමතරව සංවර්ධනයට දායකවන තවත් හේතු සාධකයන්වල භූමිකාවල වැදගත්කම හඳුනාගැනීම නිසා, පසුකාලින ව එනම් 1994 දී ජීව-පරිසර පද්ධති න්‍යාය (Bioecological Systems Theory) ලෙස පළමු නම වෙනස් කර බ්‍රොන්ෆෙන්බ්‍රෙනර් විසින් නැවත මෙම න්‍යාය ඉදිරිපත් කරන ලදී. මෙම පරිසර පද්ධතීන් සමහරක් ඍජුවත් තවත් සමහරක් වක්‍රවත් දරුවාගේ සංවර්ධනයට දායකවන ආකාරය මෙහිදී අනාවරණය කර ගත හැක. තවද එම පද්ධතීන් එකිනෙකා මත ද අන්තර්ක්‍රියා කරයි. නිදසුනක් ලෙස, දෙමාපියන් හා ගුරුවරු ඍජුව ළමයාගේ සංවර්ධනයට දායකත්වය සපයන අතර, රටක සමාජ සංස්කෘතිය හා දේශපාලන පසුබිම විසින් වක්‍රව ළමයාගේ සංවර්ධනයට බලපෑම් කරනු ලබයි. එනම් දේශපාලකයින් විසින් ගනු ලබන තීරණ-තීන්දු නිසා දරුවාගේ පෝෂණය, අධ්‍යාපනය හා දරුවාගේ සංවර්ධනය හා ඍජුව හා වක්‍රව බැඳී පවතින විවිධ ක්ෂේත්‍ර කෙරෙහි එල්ල කරන බලපෑම නිසා දරුවාගේ සංවර්ධනයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක පැතිකඩයන්හි වෙනස්කම් සිදුවිය හැකි ය. මෙම වෙනස්කම් සුබවාදී හෝ අසුබවාදී ආකාරයෙන් දරුවාගේ සංවර්ධනය තීරණය කරයි. මෙලෙස හා ඍජුව පමණක් නොව වක්‍රව බැඳී පවතින විවිධ සමාජ-පරිසර ක්ෂේත්‍රයන් විසින් දරුවාගේ සංවර්ධනය කෙරෙහි විශාල දායකත්වයක් සපයනු ලබයි. තවද මෙම න්‍යායේ අදහස් ශාස්ත්‍රීය පර්යේෂණවලට පමණක් සීමා

නොවේ. ලෝක සෞඛ්‍යය සංවිධානය (World Health Organization, UNICEF) විසින් මෙම න්‍යායාත්මක කරුණු සමාජ සංවර්ධනය සහ මිනිස් සුබසාධනය සඳහා ද යොදා ගනු ලබයි (ibid: p. 51). මෙම න්‍යායය ඉදිරිපත් කිරීමේ දී මොහු විසින් මූලික වශයෙන් සංරචක හතරක් සඳහා ප්‍රමුඛත්වය ලබා දී තිබේ. එම සංරචකයන් වනුයේ, ක්‍රියාවලිය (process), පුද්ගලයා (person), සංදර්භය (context) සහ කාලය (time) (PPCT) යන්නයි (Rosa & Tudge, 2013: p.256). මේ සංරචකයන් හතර අතර තිබෙන අන්තර්සබඳතාවය මත ළමයාගේ සංවර්ධනය තීරණය වේ. මෙම න්‍යායෙන් එම අන්තර් සබඳතාවයන් විස්තර කරයි. පහත 1 රූප සටහන මගින් ඒ ඒ සංරචකයන් හතරට අයත්වන සාධක පෙන්වා දෙනු ලබයි.




රූප සටහන් අංක 01: ජීව-පරිසර පද්ධති න්‍යාය ගොඩනගනු ලබන මූලික සංරචකයන් (PPCT)

(Resource:https://study.com/academy/lesson/bioecological-model-theory-approach.html)

මෙම සංරචකයන් වෙන වෙනම සාකච්ඡාවට ගනිමු.

## ක්‍රියාවලිය (process)

මෙය වඩාත් අර්ථ ගැන්වීම සඳහා 'proximal processes' යන වචනය බ්‍රොන්ෆෙන්බ්‍රෙනර් විසින් යොදා ගන්නා ලදී. එහි එක් අර්ථයක් වන්නේ ළමයා හා ළමයාව රැකබලා ගන්නන් අතර

අන්තර් සබඳතාවය එනම් මිනිසුන් සමග අන්තර් සබඳතාවයයි. එනම් ළමයා ළඟින් හා වැඩි කාලයක් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරු, උපදේශකයින්, ආච්චි-සීයා සමග පවතින අන්තර් සබඳතාවය විය හැක. අනෙක් අර්ථය වන්නේ ළමයා හා ළමයා නිතර ඇසුරු කරන ද්‍රව්‍යමය වස්තූන් සමග පවතින අන්තර් සබඳතාවය වේ. එනම් ළමයා නිතර භාවිත කරන ඩිජිටල් උපාංග, වීඩියෝ ක්‍රීඩා හෝ සෙල්ලම් භාණ්ඩ ද මෙයට අයත් වේ. මේවා මගින් නව කුසලතා ඉගෙනීම සිදුවේ (Bronfenbrenner, 1995: p.602).

## පුද්ගලයා (person)

මෙම සංරචකය බ්‍රොන්ෆෙන්බ්‍රෙනර් විසින් පළමු වරට මෙම න්‍යාය ඉදිරිපත් කිරීමේ දී අතපසු වූ කරුණකි. මෙහිදී අවධාරණය කරනු ලබන්නේ සංවර්ධන ක්‍රියාවලියේ දී පුද්ගල ගතිලක්ෂණ කෙතරම් වැදගත්ද යන්නයි. විශේෂයෙන් ම පුද්ගයෙක් සතුව පවතින කායික පෙනුම, බුද්ධිය, පුද්ගල හැකියාවන්, ස්ත්‍රී පුරුෂභාවය වයස, චිත්තවේග හා අභිප්‍රේරණය වැනි කාරණා අනුව කෙනෙක් අනෙක් අයට ප්‍රතිචාර දක්වන ආකාරය එනම් අන්තර් ක්‍රියාවන් සිදුවන ආකාරය තීරණය වේ. එලෙස ම මෑතකාලීනව කරන ලද අධ්‍යයනයන් මගින් පෞරුෂය තීරණය වීමෙහිලා ජීවවිද්‍යාත්මක හෙවත් ජානමය සාධක හා පරිසරාත්මක සාධක එනම් අධ්‍යාපනය, ළමයා හදාවඩා ගන්නා ආකාරය කුමන මට්ටම්වලින් දායක වන්නේදැයි තක්සේරු කිරීමට විද්‍යාඥයන් කථිකාවතක් නිර්මාණය කර තිබේ. එය 'ජානවලට එරෙහි පරිසරය' පිළිබඳ ගැටලුව ('nature vs. nurture' question) යනුවෙන් හඳුන්වයි. අද පිළිගෙන ඇති මතය වන්නේ ජීවවිද්‍යාත්මක (ජාන) හා පරිසරාත්මක යන දෙයාකාරයෙන් ම ළමයාගේ සංවර්ධනය තීරණය වන බවයි.. මෙහිදී අද පැන නැගී ඇති විවාදයක් වන්නේ මෙම ජාන හා පරිසරය කුමන ප්‍රතිශතයන්ගෙන් ළමා සංවර්ධනයට බලපාන්නේ ද යන්න ය. මේ පිළිබඳ දෙයාකාරයක මත දරණ විද්‍යාඥයන් සිටියි. ඔවුන්ව දේහජවාදීන් (Nativists) හා අනුභූතිවාදීන් (Empiricists) වශයෙන් හඳුන්වනු ලබයි. දේහජවාදීන් දක්වන්නේ ළමා සංවර්ධනය හැඩගැස්වීම සිදුවන්නේ සම්පූර්ණයෙන්ම ජාන මගින් බවයි. අනුභූතිවාදීන් දරණ මතය වන්නේ, ළමා සංවර්ධනය හැඩගැස්වීම පරිසරය මගින් සිදුවන බවයි. නමුත් වර්තමානයේ පිළිගන්නා මතය

වන්නේ මේ ආකාර දෙකම ළමා සංවර්ධනයට එකලෙස වැදගත් වන බවයි. කෙසේ වෙතත් අදටත් ඇති ප්‍රශ්නය නම් මේ ආකාර දෙකම ළමා සංවර්ධනයේ දී අන්තර් ක්‍රියා කරන්නේ කෙසේද යන්නයි. තවද මෙම සංරචකයේ දී පීඩාකාරී අවස්ථාවන් සමග ගනුදෙනු කිරීමේ දී හා චිත්තවේග පාලනයේ දී, අවධානය පාලනයේ දී වැනි තවත් එවැනි සාධක හා බැඳුණු කරුණු මගින් පුද්ගල ස්වභාවය හා සම්බන්ධ ජීවවිද්‍යාත්මක (ජාන) සාධකවල බලපෑම කෙබඳු ද යන්න සොයා බලනු ලබයි.

### සංදර්භය (context)

මෙම සංරචකය මගින් ළමයා හැදී වැඩෙන පරිසරය පිළිබඳ දක්වයි. ළමයාට පරිබාහිරෙන් මෙය පවතී. එනම් ළමයා ජීවත්වන සමාජ-ආර්ථික වටපිටාව, භූගෝලීය පසුබිම, සංස්කෘතික පසුබිම, දේශපාලනික වාතාවරණය හා ඓතිහාසික පසුබිම, සෞඛ්‍ය, අධ්‍යාපනය, ආහාර වැනි එදිනෙදා අවශ්‍යතාවන් මෙම සංදර්භයට අයත් වේ (Bronfenbrenner, 1979: p.54). එහිදී ප්‍රධාන පරිසර පද්ධති ආකාර හතරක් දක්වනු ලබයි. එනම් ක්ෂුද්‍ර පද්ධතිය (Microsystem), අන්තර් පද්ධතිය (Mesosystem), බාහිර පද්ධතිය (Exosystem) සහ මහ පද්ධතිය (Macrosystem) වේ. (මෙම පද්ධතීන් පසුව වෙන වෙන ම විස්තරාත්මකව සාකච්ඡාවකට බඳුන් කරනු ලබයි)

### කාලය (time)

මෙහිදී කාල පද්ධතිය (Chronosystem) අයත් වන්නේ කාලය යන මෙම සංරචකය යටතට ය. මෙම පද්ධතිය මගින් පුද්ගලයාගේ අභ්‍යන්තරික හා බාහිර යන දෙයාකාරයකින් සංවර්ධනය සඳහා දායකත්වය සපයනු ලබයි. (මෙම පද්ධතිය පිළිබඳ ව පසුව සාකච්ඡා කරමු.)

මේ අනුව සංදර්භය යන සංරචකය මගින් දක්වනු ලබන ප්‍රධාන පරිසර පද්ධති ආකාර හතරත් එලෙස ම කාලය යන සංරචකය යටතේ තිබෙන කාල පද්ධතියත් (Chronosystem) යන පද්ධති සියල්ල ම එක්ව ගත් කල එහිදී ළමයාගේ සංවර්ධනය තීරණය කරනු ලැබීමට බලපාන්නා වූ සමාජ-පරිසර පද්ධති පහක් යූරි බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්

විසින් ඉදිරිපත් කරනු ලබයි. එනම්, ක්ෂුද්‍ර පද්ධතිය (Microsystem&, අන්තර් පද්ධතිය (Mesosystem), බාහිර පද්ධතිය (Exosystem), මහා පද්ධතිය (Macrosystem), කාල පද්ධතිය (Chronosystem) යනුවෙනි. මෙම සමාජ-පරිසර පද්ධති පහ ළමයා වටා පිහිටා තිබෙන ආකාරය පහත 2 රූප සටහන මගින් පෙන්වනු ලබයි. ළමයා එම පද්ධතීන් සමග ගනුදෙනු කරන ආකාරය මත පද්ධති පහ නිරූපණය කර ඇති අතර ළමයාට ආසන්න ව ම හා සෘජු ව ම කටයුතු කරන සමාජ ස්ථරය ඇතුළතින් ම එනම් ළමයාට ආසන්නයේ සිට සමීපව හා සෘජුව කටයුතු කිරීම අඩුවන ස්ථර ක්‍රමක්‍රමයෙන් ඈතට විහිදෙන ආකාරයට මෙහි සඳහන් පද්ධතීන් මෙම රූප සටහන මගින් නියෝජනය කර දක්වා තිබේ. දැන් මෙම ලිපිය මගින් එම පද්ධතීන් පහ වෙන වෙන ම විස්තරාත්මකව සාකච්ඡාවකට බඳුන් කරනු ලබයි.




රූප සටහන් අංක 02: සමාජ-පරිසර පද්ධති පහ ළමයා වටා පිහිටා තිබෙන ආකාරය

(Resource: https://core-evidence.eu/posts/theories-vlog-noirin-hayes)

## ක්ෂුද්‍ර පද්ධතිය (Microsystem)

ළමයාට ඉතාම සමීපත ව ම පවතින සමාජ-පරිසර පද්ධතිය (Innermost Level) මෙය වේ. එනම් පළමු වන පද්ධතිය හෙවත්

ළමයා වඩාත් ආසන්න ව ම හෙවත් සෘජුව අන්තර් ක්‍රියා කරන පරිසරය එනම් පුද්ගලයන් හා සබඳතාවන් මීට අයත් වේ. තව දුරටත් විස්තර කරන්නේ නම්, ළමයා වැඩි කාලයක් ගතකරන හා ළමයාට කෙලින් ම අන්තර් ක්‍රියා කිරීමට හැකියාව පවතින සමාජ-පරිසරයේ ස්ථාන හා බැඳුණු පුද්ගලයන් හා සබඳතාවන් වේ (Bronfenbrenner, 1994: p. 569). මීට පවුල (දෙමව්පියන්, සහෝදර සහෝදරයින් ආදීන්) මෙම පද්ධතිය ළමයාගේ සංවර්ධනයත් සමග වෙනස් වේ. ළමයා වයසින් වැඩෙත් ම පවුලට අමතරව පාසල, සමවයස් කණ්ඩායම්, පල්ලිය, පන්සල, නෑදයන්, අසල්වාසීන් ආදී අය සමග ද අන්තර් ක්‍රියා කරයි. එමෙන් ම සංවර්ධනයට බලපාන පුද්ගලයින් මෙහිදී අඩු වැඩි වශයෙන් වෙනස් විය හැක. කෙසේ නමුත් ළමයා සමග සෘජුව අන්තර් ක්‍රියා කරන බැවින් ළමා සංවර්ධනයෙහි ලා මෙම පද්ධතියේ බලපෑම අතිමහත් ය. තවද දෙමාපිය භූමිකාව පරිණතව හා සහයෝගයෙන් රඟ දක්වන ආකාරය අනුව ළමයාගේ සංවර්ධනයට එය මනා පිටුවහලක් වන අතර, එසේ නොමැති නම් පවුලේ දෙමාපියන් එකිනෙකා අතර පවතින මතභේද, ආරවුල් සහ ප්‍රචණ්ඩකාරි හැසිරීම් නිසා ළමයා විවිධාකාරයෙන් පීඩාවට පත් වේ (Davies and Cummings, 1994: p.388). එලෙසම මෙම පද්ධතියට අයත් ළමයා වඩාත් ආසන්න ව ම අන්තර් ක්‍රියා කරන පිරිසක් වන ගුරුවරුන්ගේ හැසිරීම එනම් ගුරුවරු සහ ළමුන් අතර පවතින අන්තර් පුද්ගල සබඳතාවයේ ස්වභාවය ළමුන්ගේ ප්‍රජානන සංවර්ධනය කෙරෙහි දායක වන බවත්, විශේෂයෙන් ම ඉගෙනුම් දුර්වලතා පවතින දරුවන්ට ගුරුවරු ලබා දෙන සහයෝගය අනුව ළමුන්ට ඒවා ජය ගැනීමට හැකියාව පවතී. එලෙසම නිවසේ පවතින ආර්ථික අපහසුතා ළමයාගේ සංවර්ධනයට බලපායි. එමෙන්ම ළමයා ඇසුරු කරන අසල්වාසින් හා මිතුරන් ද ළමයාගේ සංවර්ධනයට දායක වේ (ibid p.405).

## අන්තර් පද්ධතිය (Mesosystem)

මෙය මෙම පද්ධතීන් අතර දෙවන පද්ධතිය වන අතර එය ක්ෂුද්‍ර පද්ධතියට පසුව දක්වනු ලබයි. මෙම පද්ධතිය මගින් නියෝජනය කරනු ලබන්නේ, ළමයා සමග සෘජුව සම්බන්ධතාවයන් පවත්වනු ලබන ඉහත විස්තර කළ ක්ෂුද්‍ර පද්ධතිය නියෝජනය කරන ඒකකයන් එම පද්ධතියේම පවතින අනෙකුත් ඒකකයන් හා

සමග තිබෙන අන්තර් සබඳතාවයයි (Bronfenbrenner, 1979: p. 209). දරුවාගේ සංවර්ධනයට මෙම සම්බන්ධතාවයන් ද සෘජුව බලපානු ලබයි. නිදසුනක් ලෙස දෙමව්පියන් පාසල සමග තිබෙන සබඳතාවයේ ස්වභාවය දරුවාගේ සංවර්ධනයට බලපායි (Firestein, 2019: p.225). පාසල සහ දෙමාපියන් ළමුන්ගේ සංවර්ධනය කෙරෙහි සෘජුව දායක වන ක්ෂුද්‍ර පද්ධතියේ පවතින ප්‍රබල ඒකක දෙකකි. මෙහිද දරුවා විසින් නිවසේ දී ඉගෙන ගනු ලබන චර්යාවන් හා පාසලේ දී ගුරුවරු විසින් උගන්වනු ලබන සමහර කරුණු අතර නොගැළපීම් නිසා දරුවා වියවුල් සහගත හෝ ගැටලුකාරී තත්වයකට පත්විය හැකි අතර, නිවසේ ඉගෙන ගන්නා සමහර කරුණු පාසලේ දී ලබා දෙනු ලබන දැනුම හා යහමින් ගැළපෙමින් ළමයාගේ යම් යම් චර්යාවන් උපස්ථම්භනය කරනු ලබයි. තවද එහිදී නිවසින් හෝ අසල්වාසීන්ගෙන් ඉගෙන ගන්නා යම් නොගැළපෙන චර්යාවන් නිසා පාසල තුළ හෝ අනෙක් ළමයින් අතර මෙම දරුවා කොන්වීමකට ලක්විය හැක. එලෙසම නිවසේ හෝ වටපිටාවේ පවතින ප්‍රචණ්ඩකාරී චර්යාවන් අනුකරණය කිරීමට යාමෙන් පාසලට හෝ සමාජයට එම ළමයාගේ හැසිරීම බාධාවක් විය හැක. එලෙසම දෙමාපියන් නොමැතිව හෝ දෙමාපියන් විසින් නොසලකා හරිනු ලැබූ හෙවත් නොසැලකිළිමත් දෙමාපියත්ව රටාවක් යටතේ දිවි ගෙවන ළමයෙක්ට සහානුභූතියෙන් ප්‍රතිචාර දැක්වීමේ දී, ගුරුවරයාට මෙම අන්තර් පද්ධතිය වැදගත් වේ. එනම් දරුවාගේ නිවසේ පරිසරය ගුරුවරයා දැන සිටිය යුතුයි. මෙලෙස ක්ෂුද්‍ර පද්ධති භූමිකා අතර තිබෙන සබඳතා අන්තර් පද්ධතියට ද වැදගත් වන බව බ්‍රොන්ෆෙන්බ්‍රෙනර්ගේ අදහසයි. එලෙස ම අසල්වාසින් හා දෙමාපියන් අතර පවතින සබඳතාවයේ ස්වභාවය, දෙමාපියන් හා සහෝදර සහෝදරියන් අතර මෙන්ම දෙමාපියන් හා සමවයස් කණ්ඩායම් අතර සබඳතාවයත්, සමවයස් කණ්ඩායම් මෙන් ම දෙමාපියන් හා ආගමික ස්ථාන අතර අන්තර් සබඳතාවයේ ස්වභාවය වැනි ක්ෂුද්‍ර පද්ධතියේ ඒකකයන් එම පද්ධතියේ ම පවතින අනෙකුත් ඒකකයන් හා සමග තිබෙන අන්තර් සබඳතාවය ළමා සංවර්ධනය කෙරෙහි දායක වේ. මෙලෙස සමීපතම පද්ධතිය වන ක්ෂුද්‍ර පද්ධතියේ සබඳතා මනාව හඳුනා ගෙන පවත්වා ගැනීම මගින් පුළුල් අන්තර් පද්ධතියක් සෑදෙන අතර, එහිදී ළමයාගේ සංවර්ධනයට මනා පිටුවහලක් සැපයීමට දායක වන පොදු අරමුණු සහ වටිනාකම්

පිළිබඳ මනා සන්නිවේදනයක් පැවතීම ළමයා වටා ශක්තිමත් සහ ආරක්ෂිත අන්තර් පද්ධතියක් ගොඩ නැගීමට මූලික වේ. නිදසුනක් ලෙස තමා වටා සිටින පුද්ගලයන්ට ගරු කරන ආකාරය පිළිබඳ අන්තර් පද්ධතියේ පවතින පොදු අරමුණු සහ වටිනාකම් පිළිබඳ මනා සන්නිවේදනයක් පැවතීම.

## බාහිර පද්ධතිය (Exosystem)

ක්ෂුද්‍ර හා අන්තර් පද්ධතියට ඔබ්බෙන් මෙය පිහිටා තිබේ. මෙය තෙවන පද්ධතිය වේ. මෙම පද්ධතිය සමග ළමයා සෘජුව සම්බන්ධ නොවන නමුත් මෙම පද්ධතියේ පවතින ඒකකයන් මගින් ඇති කරන බලපෑමෙන් දරුවාට මිදිය නොහැකි ය (Bronfenbrenner, 1999: p.05). මෙම පද්ධතියට අයත්වන සමහර ඒකකයන් ලෙස, දෙමාපියන්ගේ රැකියාව, ඊට අමතරව රෝහල, පොලීසිය, සමාජ සුභසාධක සේවා, ජනමාධ්‍ය වැනි ආයතන අයත් වේ. නිදසුනක් ලෙස මව හෝ පියාගේ රැකියා කරන ස්ථානය හා සමග ළමයා සෘජුව අන්තර් සබඳතා නොපවත්වන නමුත් දෙමාපියන්ට තමාගේ රැකියාව මගින් එල්ලවන පීඩනය නිසා හෝ රැකියාව අහිමි වීම, රැකියාවේ ස්ථාන මාරුවීම් වැනි කරුණු නිසා ඔවුන් මානසික ආතතියෙන් පෙළිය හැක. එම ආතතිය ළමුන් සමග අන්තර් ක්‍රියා කිරීමේ දී විවිධ අයුරින් ප්‍රකාශ විය හැක. එනම් එම පීඩනය ළමුන්ට අනිසි ලෙස බැන වැදීම, පහරදීම හෝ අඹුසැමි අඬදබර ලෙස විස්තාපනය වෙමින් ප්‍රකාශ විය විය හැකිය (Firestein, 2019: p.228). එලෙස ම දෙමාපියන්ගේ රැකියාවේ ස්ථාන මාරුවීම් නිසා නව තත්වයන්ට හුරුවීමට සිදුවීම ද දරුවන් තුළ විවිධ ගැටලුකාරී තත්වයන් උද්ගතවීමට හේතුවිය හැක (Adam, 2004: p.212). තවද සමාජයේ විවිධ ආයතනයන් විසින් ගන්නා තීරණ තීන්දු සමග සෘජුව දරුවා හවුල් නොවුවත් එම තීරණ තීන්දුවල බලපෑමට ළමයා යටත්විය යුතු ය. නිදසුනක් ලෙස පාසලට ඇඳිය යුතු ඇඳුම තීරණය කිරීමට දරුවා සෘජුව සම්බන්ධ නොවූවත් එම තීරණයට අනුව පාසල් ඇඳුම ළමයා විසින් අඳිනු ලැබිය යුතු ය. තවද සමාජයේ පවතින විවිධ සුබසාධන ක්‍රියාදාමයන් මගින් සහ විවිධ නීතිරීති සම්පාදන ආයතනයන් මගින් ගනු ලබන තීරණ තීන්දු සමග දරුවා සෘජුව ක්‍රියාකාරී නොවූවත් එමගින් ළමයාගේ සංවර්ධනයට වක්‍රව දායකත්වය සපයයි (DeParle, 2004: p.2012).

එමෙන්ම දෙමාපියන් ඇසුරු කරන සමාජය හා පුද්ගලයන් සමග දරුවා සෘජුව නොගැටෙන නමුත් දෙමාපිය ඇවතුම් පැවතුම් ආකල්ප සහ මාපියත්ව රටාවන් ඒ අනුව වෙනසකට ලක්විය හැක. මේ අනුව යමින් අද දක්වා සිදුකර තිබෙන පර්යේෂණ මගින් ළමයාට බහුලව ම බලපෑම් කරන බාහිර පද්ධතියේ ඒකක තුනක් ලෙස දෙමාපියන්ගේ රැකියා ස්ථානය (Parents' Workplaces), පවුලේ සබඳතා ජාලය සහ ප්‍රජා සංදර්භය (Community Contexts) ප්‍රධාන තැනක් ගනී (Bronfenbrenner & Morris, 1998). මෙම පද්ධතියේ පවතින විවිධ ආයතනවල කාර්යභාරය තේරුම් ගැනීම මගින් ළමයාගේ මනෝ සමාජීය සංවර්ධනයට මෙන්ම කායික, බුද්ධි සංවර්ධනයට ද එය ඉවහල් වන ආකාරය පිළිබඳ මනා වැටහීමක් ඇතිකර ගැනීමේ හැකියාව පවතී.

## මහා පද්ධතිය (**Macrosystem**)

හතරවන පද්ධතිය නියෝජනය කරන්නේ මෙම පද්ධතියයි. මේ පද්ධතියට අයත්වන්නේ සංස්කෘතියකමය වටිනාකම්, නීති, චාරිත්‍ර, උප සංස්කෘතීන්, සාරධර්ම, විශ්වාස පද්ධති, ආකල්ප, ජීවන රටාව අයත් වේ (Bronfenbrenner, 2001). තවද යම් සමාජයක පවතින දේශපාලන ක්‍රමවේදය, ආර්ථික ක්‍රමවේදය, පොදු නීති රෙගුලාසි (public policies) යන කාරණා ද මෙම පද්ධතිය තුළ පවතින අතර, සමාජ-සංස්කෘතික සංදර්භය විසින් මෙය නිර්මාණය කරනු ලබයි. එනම් මෙම පද්ධතිය නීතිමය, දේශපාලනික, ආර්ථික සහ සමාජීය පුරුදු සහ ව්‍යුහයන්ගේ එකතුවක් ලෙස නිර්මාණය වන නොවැළැක්විය හැකි සමාජමය නිෂ්පාදනයක් වන "අවකාශයකි" ("space") (Lefebvre, 1991: p.190). මෙය ඉතා පුළුල්ව පැතිර පවතින සංකීර්ණ පද්ධති ව්‍යුහයක් වේ. මෙම අවකාශයේ පවතින යම් යම් ක්‍රමවේදයන් පිළිබඳ පුද්ගලයෙක් වශයෙන් අකමැති වූවත්, එම ග්‍රහණයෙන් මිදීම පහසු කරුණක් නොවේ. එනම් කැමැත්තෙන් හෝ අකමැත්තෙන් එම සංස්කෘතික පද්ධතියට යටත්විය යුතු ය. එසේ නොමැතිනම් ඊට අභියෝග කිරීමට ඵලදායි විසඳුම් ගවේෂණය කර තිබිය යුතු ය. නිදසුනක් ලෙස ලාංකිය සමාජ-සංස්කෘතික සංදර්භය තුළ සමලිංගිකයන් පිළිබඳ දරණ මතය. තවද මෙහිදී ළමයා තම අවට සමාජයෙහි දක්නට ලැබෙන විවිධ චර්යාවන් නිරීක්ෂණය කිරීම මගින්

එම ක්‍රියාවන්ට අදාළ ව සමාජයෙන් ලැබෙන ප්‍රතිඵල අනුව තමා ජීවත් විය යුතු ආකාරය සොයා ගැනීමට තැත් කරයි. මේ අනුව ළමයා විසින් තමා ජීවත් වන සමාජ-සංස්කෘතියට සාපේක්ෂව තම ආත්ම-සංකල්පය, ආත්ම-අභිමානය, ආත්ම-සාක්ෂාත්කරණය (self-actualization) වර්ධනය කරගනු ලබයි. තවද මෙම පද්ධතිය මහ සමාජයේ පවතින නිසා ළමයාගේ සංවර්ධන ක්‍රියාවලියේ දී මෙම සමාජයේ පවතින විවිධ මතිමතාන්තර අනුව ළමයාගේ හැකියාවන් මෙන් ම එම සමාජ සංදර්භයේ ජීවත් වන අනෙකුත් පුද්ගලයන්ගේ ද හැකියාවන්ගේ සාමූහික වශයෙන් සංවර්ධනයක් එම සමාජයට සාපේක්ෂව සිදුවේ. මෙයින් ගම්‍ය වන්නේ, මෙම ස්ථරයේ බලපෑම ළමයා වටා පවතින අනෙකුත් ස්ථරයන් හෙවත් පද්ධතීන් වෙත ද බලපෑම් කරන බවයි (Bronfenbrenner, 2007). නිදසුනකින් පැහැදිලි කරන්නේ නම්, තනි දෙමාපියභාවය (single parenting) පිළිබඳ සමාජ මතය හා එවැනි මාපියන් හා ළමුන් සඳහා සමාජයේ නීති රෙගුලාසි මගින් ගොඩ නගා දී තිබෙන සුරක්ෂිතතාවය මත ළමයාගේ සංවර්ධනය තීරණය වේ. මේ නිසා යම් සමාජයක ජීවත් වන ළමයා තම සංවර්ධන ක්‍රියාවලියේ දී එම මහ සමාජය තුළ පවතින වටිනාකම් හා සාරධර්ම හඳුනාගත යුතුය. මන්දයත් ඊට අනුකූලව ළමයා තම පෞරුෂය හා ස්ව සංකල්පය වර්ධනය කර ගනී. නිදසුනක් ලෙස ඇමරිකානු ළමයෙකුගේ ස්වසංකල්පය හා අපේ රටේ ළමයෙකුගේ ස්වසංකල්පය වෙනස් වීමට හේතුව මෙම හඳුනා ගැනීම වේ. මේ අනුව ළමයා අයත්වන තම සමාජයේ පවතින නීති-රීති, චාරිත්‍ර-වාරිත්‍ර, උප සංස්කෘතීන්, සාරධර්ම, විශ්වාස පද්ධති, ආකල්ප, ජීවන රටාව, දේශපාලන හා ආර්ථික ක්‍රමවේද, පොදු නීති රෙගුලාසි අනුව ළමයාගේ සංවර්ධනයේ ධනාත්මක හෝ ඍණාත්මක පැතිකඩ තීරණය වේ. සමහර අප්‍රිකානු පවතින සමහර උප සංස්කෘතීන් හා බැඳුණු චාරිත්‍ර-වාරිත්‍ර හේතුවෙන් බාල වයස්කාරයින් විවාහ කර දීම මෙන්ම ගැහැණු ළමුන් වැඩිවියට පත්වීමේ දී සිදු කරන සෞඛ්‍යමත් නොවන ක්‍රියාවන් නිසා ශාරීරික, මානසික, සමාජ චිත්තවේගීය වශයෙන් ළමුන් පීඩාවන්ට ලක්වේ. මෙම පද්ධතියේ ගුණාත්මක බව මත පදනම්ව, මෙහි අධ්‍යාපන රෙගුලාසිවල බලපෑම නිසා ළමයාගේ අධ්‍යාපන සාර්ථකත්වයට හා අනාගත අවස්ථාවන් හඳුනා ගැනීමටත්, මෙහි පවතින පොදු නීති පද්ධතිය නිසා ළමයාගේ ආරක්ෂාව හා

යහපැවැත්මටත්, සාරධර්ම පද්ධතිය මගින් වටිනාකම් හා තම විශ්වාස පද්ධතිය ගොඩනගා ගැනීමටත්, තමන් ජීවත් වන ප්‍රදේශයට අනුව අත්දැකීම් ලබා ගනිමින් වර්ධනය වීමට ළමයාට අවස්ථාව සලසනු ලබයි.

## කාල පද්ධතිය (Chronosystem)

මෙය මෙම න්‍යායේ පස්වන පද්ධතිය හෙවත් අවසන් පද්ධතියයි. මෙහි "Chrono" යන ග්‍රීක පදයේ අර්ථය වන්නේ කාලය යන්නයි. පුද්ගලයෙකුගේ ජීවිත කාලය පුරාම සිදුවන හැම කාරණාවක් ම නියෝජනය කරමින් මෙම පද්ධතිය ගොඩ නැගෙයි. සංවර්ධනය යනු ඓතිහාසික කාලපරිච්ඡේදය පුරා මිනිස් ජීවිතවල සිදු වූ සිද්ධීන් හා වටපිටාව මගින් ප්‍රබල ව හැඩගන්වනු ලැබූවකි. එම නිසා ඉහත සඳහන් කළ හැම පද්ධතියක් මතම මෙම පද්ධතිය බලපානු ලබයි. කාලය මත සංවර්ධනය තීරණය වන අතර මෙම පද්ධතිය කෙනෙකුගේ ජීවිත කාලය තුළ වගේම පරම්පරාවන් හරහා ද පැතිර යයි (Bronfenbrenner & Morris, 2006: p.820). පුද්ගලයාගේ සමාජ පරිසරයේ සිදුවන සිදුවන සිදධීන් ඔහුගේ ජීවිතයේ සිදුවන සිද්ධීන් මෙන්ම ඓතිහාසික සිදුවීම් මීට අයත් වේ. එලෙසම පුද්ගල ජීවිතයේ වයසත් සමග බොහෝ අය බලාපොරොත්තු වන වෙනස්කම් එනම් ආකෘතික අත්දැකීම් සහ එසේ බලාපොරොත්තු නොවන වෙනස්වීම්වලින් යුක්ත එනම් ආකෘතික නොවන අත්දැකීම්වලින් මෙම පද්ධතිය සමන්විත වේ. මෙහිදී වයස පදනම් කරගත් ආකෘතික අත්දැකීම් යනු සමාජයේ ජීවත් වන සියලු ම හෝ බොහෝ පුද්ගලයන්ට මුහුණදීමට සිදුවන අත්දැකීමක් වේ. එනම් වැඩිවියට පත්වීම, විවාහ වීම, දරුවන් හැදීම, රැකියාවක් කිරීම, විශ්‍රාම යාම වැනි සිදුවීම් ය. ආකෘතික නොවන අත්දැකීම්වලට අයත් වන්නේ, විභාගය අසමත්වීම හෝ දෙමාපියන්ගේ දික්කසාදය, මව හෝ පියාගේ මිය යාම, පදිංචිය වෙනස්වීම හෝ බරපතල අසනීපයක් වැළඳීම, ස්වභාවික ආපදා හෝ වසංගත වැනි තත්වයන් ය. නිදසුනක් ලෙස දෙමාපියන්ගේ වෙන්වීම නිසා පසුකාලීනව ළමයා විෂාදය වැනි මානසික ගැටලුකාරී තත්වයන්ට ගොදුරුවීමේ සම්භාවිතාව වැඩි වේ (Bohman et. al., 2017). එලෙසම යටත් විජිත හෝ යුද්ධ සමයේ අත්දැකීම් ඇති ළමුන් බොහෝමයක් පසුකාලීන ව වැඩිහිටි වියට පත්වන විට

මෙන් ම ඔවුන්ගේ ඉදිරි පරම්පරා කිහිපයක් දක්වා ම ඒවායින් ලැබූ අත්දැකීම් නිසා කාංසාමය, ආත්ම-අභිමානය හීනවීම, විෂාදමය වැනි හැඟීම්වලින් යුක්ත වූ බව සහ ඔවුන්ගේ ශරීර හැඩය, සමේ පැහැය සහ මුහුණේ අංගයන් පිළිබඳ ව හීනමානයකින් පසු වූ බවත් හෙළිවී තිබේ (Utsey, 2015: p.201). තවද තාක්ෂණික උපාංගවල දියුණුවත් සමග සමාජයේ විවිධ පැතිකඩවල වෙනස්කම් මෙන්ම වර්තමානයේ ළමයා සිතන පතන රටාව හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් හා අන්තර් සබඳතාවයන්ගේ ස්වභාවයට ද ධනාත්මක මෙන්ම සෘණාත්මක යන දෙයාකාරයෙන් ම වෙනස්කම් ඇතිවී තිබේ. නිදසුනක් ලෙස සමාජ ජාල, අන්තර් ජාලය භාවිතය මගින් නව දැනුම ගවේෂණයට අවස්ථාව මෙන්ම එය භාවිත කරන ආකාරය මත තම අනන්‍යතාවයට හානියක් සිදුවීමේ අවස්ථා ද පවතී. තවද කොවිඩ්-19 වසංගතය නිසා ළමුන් තාක්ෂණික මෙවලම් භාවිතයෙන් ඉගෙනීමේ යෙදීම හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කැපී පෙනෙන වෙනස්කම් රැසක් ඇතිවූ අතර මෙය ළමයාගේ සංවර්ධනයට විවිධ අයුරින් බලපෑම් කර ඇත. මේ නිසා තම සංවර්ධන ක්‍රියාවලියේ දී, සමාජ සංවර්ධනයේ ඓතිහාසික පසුබිම ළමයා විසින් හඳුනාගත යුතු ය. අද පවතින තත්වයට පුද්ගල සමාජය විකාශනය සිදුවූ ආකාරය පිළිබඳ දැනුමක්, අවබෝධයක් ළමයාට තිබිය යුතු ය. මෙම අවබෝධය මගින් පවතින සමාජ සංදර්භය නිවැරදි ව තේරුම් ගැනීමට ළමයාට හැකියාව ලැබේ. ඒ අනුව මෙය ළමයාගේ මනෝසමාජීය සංවර්ධනය වීමෙහි ලා මනා ව උපකාරී වේ.

**න්‍යායයේ වැදගත්කම හා භාවිතය**

මේ නිසා ළමයෙකුගේ සංවර්ධනය හුදෙක් ජීවවිද්‍යාත්මක තත්වයන් මත පමණක් පදනම් නොවේ. එනම් ජීවවිද්‍යාත්මක කාරණාවලට අමතර ව ළමයා වටා තිබෙන සියලු ම පරිසර පද්ධතීන්ගේ ප්‍රතිඵලයක් ලෙස ද ළමයෙකුගේ සංවර්ධනය සිදුවන බව මෙම න්‍යාය මගින් ප්‍රත්‍යක්ෂ වේ. එලෙසම ළමයෙකුගේ සෞඛ්‍යමත් යහපැවැත්ම සංවර්ධනයෙහිලා ජීවවිද්‍යාත්මක සාධක පමණක් නොව සමාජ, ආර්ථික හා ළමයා ජීවත්වන භෞතික පරිසරය ද එකසේ ඉවහල් වේ. මෙම න්‍යායේ පවතින ප්‍රායෝගික බව නිසා විවිධ පර්යේෂණ හා සායනික පුහුණුවේ දී මෙම න්‍යායාත්මක යෙදීම් බහුලව භාවිතයට ගනු ලැබේ. එලෙස ම ළමයාගේ මෙන් ම සමස්ත

පුද්ගල සංවර්ධන ක්‍රියාවලිය තුළ යහපැවැත්ම තහවුරු කිරීමට අදාළ සන්දර්භයන්වල කාර්යභාරය හඳුනා ගැනීමට සහ එමගින් අවශ්‍යවන නීති ප්‍රතිපාදනයටත් මෙම න්‍යායාත්මක සංකල්ප යොදා ගත හැක (Stokols, 1996). එලෙසම කායික මා මානසික යහපැවැත්ම වැඩි දියුණු කිරීම සඳහා සැලසුම් සැකසීමට අවශ්‍ය කරන සංකල්පීය රාමුව නිශ්චය කර ගැනීමට මෙම න්‍යාය උපයෝගී කරගත හැකි අතර එමගින් රෝග වැළැක්වීම හා සෞඛ්‍ය ප්‍රවර්ධනය හරහා පුද්ගල සෞඛ්‍ය නගා සිටුවීමට ආධාර සපයනු ලබයි. තවදුරටත් විස්තර කරන්නේ නම්, ශාරරික හා මානසික සෞඛ්‍ය පිරිහීමට බලපාන පරිසර සන්දර්භයන් හා බැඳුණු හේතු විශ්ලේෂණය කිරීමෙන් මෙය සිදු කළ හැක. නිදසුනක් ලෙස දෙමාපිය ආරවුල් හා දරුවාගේ මානසික ගැටලු අතර අන්තර් සබඳතාවය හඳුනා ගෙන එම තත්වය වැළැක්වීමට හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධනයට අවශ්‍ය කරන පියවරයන් සැකසීමට අදාළ පවුල් පරිසරයේ හේතු සාධක හා ප්‍රතිඵලයන් මෙම න්‍යායාත්මක රාමුව භාවිතය තුළ මැනවින් වටහා ගත හැකිය.

**නිගමනය**

ළමයෙකුගේ සංවර්ධනය සඳහා ජීවවිද්‍යාත්මක කාරණා මෙන් ම ළමයා වටා තිබෙන සියලු ම පරිසර පද්ධතීන්ගේ අන්තර් සම්බන්ධතාවය ද ඉතාමත් වැදගත් මෙහෙවරක් ඉටුකරන බව මෙම න්‍යාය මගින් ප්‍රත්‍යක්ෂ වේ. එනම් ඉහත විස්තර කරන ලද පද්ධති එකිනෙකින් වෙන් කළ නොහැක. එය එකක් තවෙකක් හා බැඳී පවතී. එනම් එක් පද්ධතියක නැතිනම් ස්ථරයක සිදුවන වෙනස්කමක් නිසා ඇතිවන බලපෑම අනිත් පද්ධතිය හරහා ගමන් කරන බව පැහැදිලි ය. තවද මෙම න්‍යායයේ පවතින ප්‍රායෝගික බව නිසා මනෝවිද්‍යාඥයන් හා චිකිත්සකයන් විසින් විවිධ පර්යේෂණ හා සායනික පුහුණුවේ දී මෙම න්‍යායාත්මක යෙදීම් බහුල ව භාවිතයට ගනු ලැබේ. තවද මෙම න්‍යාය මගින් ළමයාගේ සංවර්ධනයට දායක වන මූලික සංරචකයන් සියල්ල ම පාහේ සාකච්ඡාවට යොමු කර තිබෙන අතර එය ළමයාගේ සංවර්ධන ක්‍රියාවලිය හා බැඳී පවතින සාධක විශ්ලේෂණයට අවස්ථාව සපයයි. මේ අනුව ළමයාගේ යහපැවැත්ම (wellbeing) වැඩි දියුණු කිරීමට සුදුසු පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ක්‍රමවේදයන් සකස් කිරීමටත් ළමයාගේ සංවර්ධනය සඳහා දායකවන කාරණාවන් මනාව

තේරුම් ගෙන ළමයාගේ සංවර්ධන ක්‍රියාවලිය නිවැරදි ව සැකසීමට අවැසි පදනම සැකසීමටත් මෙම න්‍යායයේ විස්තර කරනු ලබන සංකල්පයන් මනා පිටිවහලක් වන බව ඉහත දී සාකච්ඡා කළ කරුණු ඔස්සේ ගම්‍ය වේ.

## ආශ්‍රිත මූලාශ්‍රය නාමාවලිය

Adam, E. K. (2004). *Beyond quality: Parental and residential stability and children's adjustment. Current Directions in Psychological Science*, 210-213. Available at: https://doi.org/10.1111%2Fj.0963-7214.2004.00310.x (Accessesed: 14 February 2023)

Bohman, H., Låftman, S. B., Päären, A., & Jonsson, U. (2017). *Parental separation in childhood as a risk factor for depression in adulthood: a community-based study of adolescents screened for depression and followed up after 15 years*. BMC psychiatry, 17(1), 117. Available at: https://doi.org/10.1186/s12888-017-1252-z (Accessesed: 17 February 2023)

Bronfenbrenner, U. (1979). *The ecology of human development: Experiments by nature and design*. Cambridge, MA: Harvard University Press.

Bronfenbrenner, U. (1994). Nature-Nurture reconceptualized in developmental perspective: A bioecological model. *Psychological Review*, 101(4), 568-586.

Bronfenbrenner, U. (1995). *Developmental ecology through space and time: a future perspective*. In P. Moen, G. H. Elder, & K. Luscher (Eds.), Examining lives in context: Perspectives on the ecology of human development. American Psychological Association, p. 599–618.

Bronfenbrenner, U. (1999). Environments in developmental perspective: Theoretical and operational models. In S. L. Friedman & T. D. Wachs (Eds.), *Measuring environment across the life span: Emerging methods and concepts*, American Psychological Association Press. p. 3–28.

Bronfenbrenner, U. (2001). The bioecological theory of human development. In N. J. Smelser & P. B. Baltes (Eds.), I*nternational encyclopaedia of the social and behavioural sciences*, Elsevier.

Bronfenbrenner, U., & Morris, P. A. (1998). The ecology of development processes. In W. Damon (Series Ed.) & R. M. Lerner (Vol. Ed.), *Handbook of child psychology. Vol. 1*. Theoretical models of human development, Wiley.

Bronfenbrenner, U., & Morris, P. A. (2006). The biological model of human development. In W. Damon & R. M. Lerner (Eds.), *Handbook of child psychology*: *Theoretical models of human development* (6th ed., Vol. 1, pp. 793-828). New York, NY: Wiley.

Bronfenbrenner,U. (2007). *The bioecological model of human development*. Available at: http://onlinelibrary.wiley.com/doi/10.1002/9780470147658.chpsy0114/abstract (Accessesed: 17 February 2023)

Damon, W., & Lerner, R. M. (1998). *Handbook of child psychology: Theoretical models of human development*. New York, NY: Wiley.

Davies, P. T. and Cummings, M. T. (1994). *Marital conflict and child adjustment: An emotional security hypothesis*. Psychological Bulletin, p. 387-411.

DeParle, J. (2012) *Welfare limits left poor adrift as recession hit New York Times*. Available at: https://www.nytimes.com/2012/04/08/us/welfare-limits-left-poor-adrift-as-recession-hit.html (Accessesed: 15 February 2023)

Firestein, C. (2019). *Advising students who struggle due to traumatic events. Academic Advising Today*, 42(2): 220- 228. Available at: https://nacada.ksu.edu/Resources/Academic-Advising-Today/View-Articles/Advising- Students-Who-Struggle-Due-To-Traumatic-Events.aspx (Accessesed: 16 February 2023)

Firestein, C. (2019, June). A*dvising students who struggle due to traumatic events. Academic Advising Today*, 42(2): 220-228. Available at: https://nacada.ksu.edu/Resources/Academic-Advising-Today/View-Articles/Advising-Students-Who-Struggle-Due-To-Traumatic-Events.aspx (Accessesed: 14 February 2023)

Lefebvre, H. (1991). *The production of space*. Hoboken, NJ: Blackwell Publishing.

Rosa, E. M., & Tudge, J. (2013). Urie Bronfenbrenner's theory of human development: Its evolution from ecology to bioecology. *Journal of Family Theory & Review*, 5(4), p. 243-258.

Stokols, D. (1996). *Translating Social Ecological Theory into Guidelines for Community Health Promotion. Sage Journals*, Volume 10, Issue 4, Available at:: https://doi.org/10.4278/0890-1171-10.4.282 (Accessesed: 17 February 2023)

Utsey, S.O., Abrams, J.A.,Opare-Henaku,A., Bolden, M.A. , & Williams, O. (2015). Assessing the psychological consequences of internalized colonialism on the psychological well-being of young adults in Ghana. *Journal of Black Psychology* 41(3),195–220